

MALIYADEVA COLLEGE

# මලිදෙව් සිරිත

2025.01.30



# ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා.... අප ශ්‍රී.... ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා....
සුන්දර සිරිබරිනී
සුරැඳි අති සෝබමාන ලංකා....
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි
ජය භූමිය රම්‍යා
අප හට සැප සිරි සෙත සදනා....
ජීවනයේ මාතා....
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා....
අප ශ්‍රී.... ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා....
ඔබ වේ අප විද්‍යා.... ඔබ මය අප සත්‍යා....
ඔබ වේ අප ශක්ති.... අප හද තුළ භක්ති....
ඔබ අප ආලෝකේ.... අපගේ අනුප්‍රාණේ....
ඔබ අප ජීවන වේ.... අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ
නිතින අප පුබුදු කරන් මාතා....
ඥාන වීර්‍ය වඩවමින රැගෙන යනු
මැන ජය භූමි කරා....
එක මවකගෙ දරු කැල බැවිනා....
යමු යමු වී නොපමා....
ප්‍රේම වඩා සැම භේද දුරැර දා....
නමෝ නමෝ මාතා.... අප ශ්‍රී.... ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා




ආයුබෝවන් පුතේ,
ඔයාව මලියදෙවයට
ආදරයෙන් පිළිගන්නවා.


# පුතා දන්නවද මලියදෙවය පටන් ගත්තේ කවදාද කියලා?





**1888 වර්ෂයේදී**
**මීට අවුරුදු එකසිය තිස්හයකටත්**
**වඩා කලින්...**



පූජ්‍ය
නැකැත්තේ ආනන්ද හිමි


සර් හෙන්රි
ඕල්කට්තුමා


අනගාරික
ධර්මපාල තුමා


හුළුගල්ල
අධිකාරම් තුමා


ඩී.පී.සී. ආටිගල
මැතිතුමා



ඒ.එම්. අබේගුණවර්ධන
මැතිතුමා


සර් ජෝන් කොතලාවල
මැතිතුමා


දොස්තර
ඒ.කේ.ටී. ද සිල්වා මැතිතුමා


යූ.බී. වන්නිනායක
මැතිතුමා


පී.යී. මඩවල මැතිතුමා


ටී.බී. මඩවල මැතිතුමා

# පුතේ මලියදෙවය පටන්ගන්න උගතුන් බුද්ධිමතුන් බොහෝ දෙනෙක් දායක වෙලා තියනවා.

# මුලින්ම මලියදේවය තිබුණේ කුරුණෑගල නගර මධ්‍යයේ බෝධිරාජ මාවතේ



## ඊට අවුරුදු ගානකට පසු 1936 දී මලියදේවය දැන් තියෙන තැනට ගෙනාවා



# මලියදෙවය
# සිංහල බෞද්ධ පාසලක්.

ඒ හින්දම අනිත් ජාති ආගම් වලට ගරු කරමින් එකමුතුව වැඩ කරන්න මලියදෙවයේ අපට පුළුවන්.





# මලියදෙවයේ ළමයි
# හොඳයි... කීකරුයි...

# මලියදෙවයේ ළමයි ඉගෙනගන්න ආසයි...



# මලියදෙවයේ ළමයි ක්‍රීඩාවට උනන්දුයි... කඩිසරයි...



# මලියදෙවයේ ළමයි කාටත් උදව් කරනවා.



# මලියදෙවයේ ළමයි
# පිරිසිදුයි... පිළිවෙලයි...









# මලියදෙවයේ ළමයි
# බොරු කියන්නෙ නෑ...



# මලියදෙවයේ ළමයි
# රටට ආදරෙයි...

# පුතේ,
# එන්න මලියදෙවය ඇතුළේ
# ඇවිදින්න යන්න




මේ තියෙන්නෙ බුදු මැදුර
අපි මෙතනින් යන එන හැම වතාවෙම
අපි හැමෝම වැඳලා තමයි යන්නෙ

# මේ අපේ මලියදෙවයේ ප්‍රාථමිකය




**මෙතනින් තමයි මලියදෙවය සුවඳවත් කරන ඔයාල වගේ පුංචි මල් කැකුළු පිපෙන්නෙ.**



**විදුහලේ ප්‍රධාන ශාලාව තියෙන්නෙ**
**විදුහලට ඇතුල් වෙන තැනමයි.**

ඒක තමයි මලියදේවයේ ප්‍රධානම ගොඩනැගිල්ල
ඒකෙ තමයි විදුහල්පතිතුමා ඉන්නෙ.
ඒ කියන්නෙ "අපේ ලොකු සර්"

# විදුහල්පතිතුමාගේ පණිවිඩය




ආදරණීය පුතණුවනි,
මලිදෙව් තුරුලට පැමිණි ඔබ සෙනෙහසින් පිළිගනිමි. මලිදෙව් මාතාවගේ ගෞරවනීය පුතෙකු ලෙසින් හොඳින් ඉගෙන ගෙන හෙට දිනයේ යහගුණයෙන් සපිරි රටට වැඩදායී පුරවැසියකු වනු දැකීම මාගේ පැතුමයි. ඒ සදහ ඔබට ශක්තිය ධෛර්යය වාසනාව ලැබේවා ! යි ප්‍රාර්ථනා කරමි.

විදුහල්පති
ඩබ්.එම්.සී.කේ. මහමිතව


පුතේ,
මලියදේවයේ දරුවන් ගායන, වාදන,
නර්තන හැකියාවන්වලට
දස්කම් දක්වනවා



විදුහලේ අනිත් පැත්තෙ
කෙලවරේම තමයි
ක්‍රීඩා පිට්ටනිය තියෙන්නෙ.
මෙතන අපි දුවමු... පනිමු...
සෙල්ලම් කරමු....

# මලියදෙවයේ දරුවන් නිවාස හතරකට බෙදිලා ක්‍රීඩා කරනවා. ඒවා තමයි




ඔයාටත් නිවාසයක් අයිතියි

# පුතේ,
# මලියදෙවයේ දරුවන් බොහෝ ක්‍රීඩා අංශ ගණනාවකට දස්කම් දක්වනවා





# පීනන්න ආස නම්
# මේ තියෙන්නෙ
# පිහිනුම් තටාකය

# විද්‍යාලයීය ආදර්ශ පාඨය

විද්‍යා භූෂණං - පුරුෂ භූෂණම්

විද්‍යාව මිනිසාට ආභරණය කි

# ගාථා පාඨය

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධානුසාසනං

නරක දේ නොකිරීම
හොඳ දේ කිරීම
තම සිත පිරිසිදු කර ගැනීම
බුදුවරුන්ගේ අනුශාසනයයි

මේ අනුව ඔබ හැඩ ගැසීමෙන්
සාර්ථක ජීවිතයක්
උදාකර ගත හැකිය

# විද්‍යාලයීය ලාංඡනය

| | |
|---|---|
| හස්තියා | ඇතුගල්පුරය |
| නෙළුම් මල් තුනයි | ත්‍රිවිධ රත්නය |
| මලක පෙති හතයි | සත්කෝර්ලය |
| ආදර්ශ පාඨය | විද්‍යා භූෂණං - පුරුෂ භූෂණම්<br>විද්‍යාව මිනිසාට ආභරණයකි<br>(මෙය විද්‍යාල ලාංඡනයෙහි මුල සිටම සංස්කෘත භාෂාවෙන් දක්වා ඇත.) |
| වර්ණ | නිල් (Navy Blue)<br>මදටිය රතු (Maroon)<br>කහ (Gold) |

# මේ තමයි පුතාට මලියදේවයේදී මුණ ගැසෙන මුල්ම ගුරු මණ්ඩලය



## පුතා මලියදේවයට ආපු මුල් දවසේ මෙන්න මෙහෙමයි.

පුතාගේ නම : ______________________

පන්තිය : 1 ශ්‍රේණිය ______

පන්ති භාර ගුරුතුමිය : ______________________

# මේ වගේ ශ්‍රේෂ්ඨ ආදි මලියදෙව් පුතුන්
# දස දහස් ගණනක් මේ පින්බිමෙන් බිහිවුණා



ජනාධිපති නීතිඥ
**ජයන්ත ජයසූරිය මැතිතුමා**
45 වන නීතිපති - 2016
47 වන අගවිනිසුරු - 2019

---




ජෙනරාල්
**දයා රත්නායක මැතිතුමා**
20 වන යුද හමුදාපති - 2013 - 2015

---



**රංගන හේරත්**
ටෙස්ට් ක්‍රිකට් නායක - 2016

## පුංචි පුතේ, ඔයත් අනාගතේදී ඒ වගේ කෙනෙක් වෙන්න හිතට ගන්න




"මලියදෙවයේ දරුවන්
මලියදෙවයට
සැමදා ආදරෙයි."



# පාසල් ගීතය

පායන සඳ අඹරේ ආ....
පායන සඳ අඹරේ
ලෙසිනා සැම කල් සුදිලේ මලිදෙව්
පාසල් මාතා අපේ ආ....
පායන සඳ අඹරේ
බේදා ආගම් කුළ මල ඈ
නොතකා එක සේ සහර බෙදා //
ශාස්ත්‍ර කලා සැම විද්‍යා //
දත් මහ පඬුවන් බිහි කරවා
දිනේවා කිතුරැස් විහිදා ලෙසිනා
පායන සඳ අඹරේ ආ....
පායන සඳ අඹරේ
ලෙසිනා සැම කල් සුදිලේ මලිදෙව්
පාසල් මාතා අපේ

- සැකසුම -

**අධ්‍යාපන අනු කමිටුව**

- සංකල්පය -

**විදුහල්පති, ඩබ්. එම්. සී. කේ. මහමිතව**

මලියදෙව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ තිළිණයකි.